ඇමුණුම 01

**<u>ජ්‍යෙෂ්ඨ පුරවැසියන් උදෙසා ස්වයං රැකියා වෙනුවෙන් ආධාර සැපයීම</u>**

**වැඩසටහන පිළිබඳ හැඳින්වීම.**

ශ්‍රී ලංකාවේ ජනගහනය සීඝ්‍රයෙන් වියපත් වෙමින් සිටි. මෙම වියපත් වන ජනගහණය ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම අත්‍යාවශ්‍ය කරුණකි. ඒ අනුව වියපත්වන මෙම ජනගහනය සතු ස්වයං නිර්මාණශිලි හැකියාවන් හා අත්දැකීම් පදනම් කර ගනිමින් ඔවුන්ව ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම හා රටේ ආර්ථිකයට සවියක් වන වැඩිහිටි ප්‍රජාවක් නිර්මාණය කිරීම හා ඔවුන්ව දළ දේශිය නිෂ්පාදිතයේ කොටස් කරුවන් ලෙස දිරි ගැන්වීම මෙම වැඩසටහනේ අපේක්ෂිත අරමුණ වේ. ඒ අනුව දිවයින පුරා විසිරී සිටින වයස අවුරුදු 60 ට වැඩි නිර්මාණශීලිත්වයෙන් හෙබි හා ස්වයංව සිය ජීවන රටාව ඉදිරියටත් ගෙන යා යුතු යැයි විශ්වාස කරන වැඩිහිටියන් සඳහා මෙම ව්‍යාපෘතිය ප්‍රයෝජනවත් වේ.

ඒ අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම සඳහා එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින් ප්‍රතිලාභීන් දෙදෙනකු පමණක් තෝරා ගන්නා අතර,දැනට ස්වයං රැකියා කරගෙන යන කණ්ඩායම් හෝ තනි පුද්ගලයන් සඳහා රුපියල් 50,000.00 ක උපරිමයකට යටත්ව අවශ්‍ය උපකරණ,යෙදවුම්,යන්ත්‍ර සූත්‍ර,අමු ද්‍රව්‍ය,රෝපණ ද්‍රව්‍ය හෝ පුහුණු ක්‍රම සඳහා ලබාදෙනු ලබයි. ප්‍රතිලාභීන්ගේ නාම ලේඛනය ඉදිරිපත් කිරිමේදී ප්‍රතිලාභින්ගේ ප්‍රමුඛතාවයේ අනුපිළිවෙලට ලේඛනය ඉදිරිපත් කළයුතු අතර, ඉල්ලීම් ප්‍රමුඛතාවය අනුව එක් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයකින් උපරිම ප්‍රතිලාභින් 03 දෙනෙකු සඳහා පමණක් මෙම ආධාරය ලබා දේ.

**<u>සුදුසුකම්/ප්‍රතිලාභින් තෝරා ගැනීමේ නිර්ණායක.</u>**

01 ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 60 සම්පූර්ණ කරන ලද අඩුආදායම්ලාභීන් විය යුතුය.

02 දැනට ස්වයං රැකියාවක් ලෙස යම් කර්මාන්තයක් හෝ වගාවක් සිදු කරන්නේ නම් එය වැඩිදියුණු කර ගැනීම සඳහා වන ඉල්ලීම් වලට ප්‍රමුඛස්ථානය ලබාදීම යෝග්‍ය වන අතර,නව ස්වයං රැකියා ව්‍යාපෘති ආරම්භ කිරීමට බලාපොරොත්තු වන ප්‍රතිලාභීන්ට ද හැකියාව මත අයදුම් කළ හැකිය.

03 ස්වයං රැකියා සඳහා කණ්ඩායමක් ලෙස ඉල්ලුම් ඉදිරිපත් කරන විට එම කණ්ඩායම සඳහා ද ලබාදිය යුත්තේ උපරිම රුපියල් 50,000.00 ක් පමණි.

04 ඇස්තමේන්තුගත මුදල රුපියල් 50,000.00 ඉක්මවන විට ඉතිරි මුදල් සපයාගන්නා ආකාරය පිළිබඳ සඳහන් කළ යුතුය.

05 ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පත්‍රය හෝ වැඩිහිටි හැඳුනුම්පත්‍රයේ පිටපතක් ඉදිරිපත් කිරිම අනිවාර්ය වේ.

06 ස්වයං රැකියාලාභීන් හඳුනා ගැනීම සමාජ සේවා නිලධාරි/පළාත් සමාජ සේවා නිලධාරි/වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි/සංවර්ධන නිලධාරි(වැඩිහිටි) විසින් සිදුකළ යුතු අතර අදාළ ඉල්ලුම් පත්‍රය ග්‍රාමසේවා නිලධාරිගේ හා ප්‍රාදේශිය ලේකම්ගේ නිර්දේශ සහිතව ඉදිරිපත් කළ යුතුය.

## ප්‍රමුඛතාව/ප්‍රතිලාභීන් තෝරා ගැනීම

01.වගාවන් ආශ්‍රිත ස්වයං රැකියා සිදු කරගෙන යෑම.(උදා - කහ/ඉඟුරු/කොච්චි/බිම්මල් ආදි වගාවන්). කහ වගාව වැනි කෙටි කාලීන වගාවන් සඳහා පර්චස් 05 ක් හෝ ඊට වැඩි භූමි ප්‍රමාණයක් තිබීම අනිවාර්යය වේ.

02 වෙළෙඳපොළ වටිනාකමක්/ඉල්ලුමක් සහිත වර්තමානයේ අපෙන් ගිලිහී යන ඉපැරණි සාම්ප්‍රදායික කර්මාන්ත (වට්ටි,පැදුරු වියීම,පන් ආශ්‍රිත, බීරළු කර්මාන්තය) වලට අදාල අවශ්‍ය උපකරණ/මෙවලම් ආදිය මිලදී ගැනීම සඳහා.

03.දැනට සිදු කරගෙන යන ස්වයං රැකියා සඳහා අවශ්‍ය උපකරණ/යන්ත්‍ර ආදිය මිලදී ගැනීම සඳහා.

04.අමු ද්‍රව්‍ය හෝ රෝපණ ද්‍රව්‍ය මිලදී ගැනීම.

05.අළෙවි කුටි ඉදිකිරිම හා අලුත්වැඩියාව.

06.අවශ්‍ය තාක්ෂණික උපදෙස් හා පුහුණුව.

## ක්‍රියාත්මක ක්‍රමවේදය

01. අදාල ස්වයං රැකියාව සම්බන්ධව වර්තමාන තත්ත්වය හා අනාගත ඉලක්ක ඇතුලත් ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. එය විධිමත් වියදම් ඇස්තමේන්තුවක් සහිත ව්‍යාපෘති වාර්තාවක් විය යුතුය.
02. අදාල ස්වයං රැකියාව සිදු කරගෙන යෑමේදී ඊට සුදුසු තාක්ෂණික නිලධාරීන්ගේ සහය ලබා ගතයුතු ය.

## පසු විපරම්

01 එක් ප්‍රතිලාභියෙකු හෝ කණ්ඩායමක් සඳහා රුපියල් 50,000.00 ක මූල්‍ය ප්‍රතිපාදන සඳහා එක් වතාවක් පමණක් ගෙවීම් කල යුතුය.

02 අදාල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සමාජ සේවා නිලධාරී/පළාත් සමාජ සේවා නිලධාරී/වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරී /සංවර්ධන නිලධාරී(වැඩිහිටි) විසින් මුදල් භාරගැනීමේ කුවිතාන්සිය (172 පොදු ) මෙම කාර්යාලය වෙත යොමුකළ යුතුය.

03 ප්‍රතිලාභීන් වෙත මුදල් ලබාදුන් බවට සහතික කරන වාර්තාව මෙම කාර්යාලය වෙත යොමු කළ යුතුය.

04 අදාල ප්‍රතිලාභින්ගේ ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් සමාජ සේවා නිලධාරි/පළාත් සමාජ සේවා නිලධාරි/වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි/සංවර්ධන නිලධාරි ( වැඩිහිටි ) විසින් මාස 03 කට වරක් ත්‍රෛමාසික වාර්තාව (ඇමුණුම් - 05) සම්පූර්ණ කොට එවීම අනිවාර්ය වේ.

05 එමෙන්ම ත්‍රෛමාසික වාර්තාව සම්පූර්ණ කොට එවීමේ දී එම ස්වයං රැකියාවට අදාල ඡායාරූප ඇමිණීම අනිවාර්ය වේ.

06 පසුවිපරම් කටයුතු වලදී අදාල ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය පිළිබඳ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලීය නිලධාරීන් විසින් පසුවිපරම් කටයුතු සිදුකරනු ලබයි.